## ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව - 2015

-----------------------------------------------------

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනතේ 76(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සභාවේ සභාපතිවරයා වෙත යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 දේපල, පිරියත හා උපකරණ හි දක්වා ඇති පරිදි ශේෂපත්‍ර දිනයට තීරණය කළයුතු සාධාරණ අගයෙන්, ධාරණ අගයන් ප්‍රමාණාත්මකව වෙනස් නොවන බව තහවුරු කර ගැනීම සඳහා සභාව විසින් එහි දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. තවද, අඛණ්ඩව භාවිතා කළ 2015 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.4,698,221 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම්වල සත්‍ය අගය පෙන්නුම් කිරීම සඳහා ප්‍රමිතිය ප්‍රකාරව ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

වර්ෂය අවසානයේ සිදු කරනු ලබන ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සමීක්ෂණයෙන් හඳුනා ගන්නා තොගවල වටිනාකම අවසන් තොගය ලෙස ගිණුම්ගත කළයුතු නමුත් වර්ෂ අවසාන භෞතික සමීක්ෂණය කර තිබියදීත් ඒ වෙනුවට පොත් ශේෂය වූ රු.740,593 ක් අවසන් තොගය ලෙස ගිණුම්ගත කර තිබුණි.

#### 2.2.3 නොසැසඳූ පාලන ගිණුම්

ආදායම් ශීර්ෂ 05 ක මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂ හා උපලේඛන අනුව ශේෂ අතර රු.144,250 ක වෙනසක් නිරීක්ෂණය විය.

#### 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 ජනවාරි 01 දින සිට නියාමන සභාව වෙත පවරා තිබුණු ගිණුම් ශේෂ 06 ක් නියාමන සභාව විසින් ආරම්භක ශේෂ ලෙස ගිණුම්වලට ගැනීමේදී එකතුව රු.13,488,488 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) පරමාණුක බලශක්ති මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ (මූල්‍ය හා පරිපාලන) ගේ 2015 සැප්තැම්බර් 30 දිනැති ලිපිය අනුව සභාව වෙත පැවරූ වත්කම් ශීර්ෂ 03 ක වටිනාකම සභාවේ පොත් වලට ගැනීමේදී එකතුව රු.4,466,846 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) පරමාණුක බලශක්ති මණ්ඩලයේ ගිණුම් අනුව සභාවට රු.1,198,533 ක් වූ ගෙවිය යුතු ශේෂයක් පැවතියද සභාවේ ගිණුම් අනුව එවැනි ශේෂයක් හඳුනාගෙන නොතිබුණි.

(ඈ) පරමාණු බලශක්ති මණ්ඩලයේ ගිණුම් අනුව, සභාව ණයගැතියෙකු ලෙස රු.4,610,165 ක ශේෂයක් පෙන්නුම් කල නමුත් සභාවේ පොත් අනුව එම ශේෂය රු.4,591,857 ක් ලෙස දක්වා තිබුණි.

**2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව විධිමත් දිරි දීමනා ක්‍රමයක් පිළියෙල කිරීමෙන් තොරව හා මහා භාණ්ඩාගාරයෙන් ඊට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමෙන් තොරව සභාව විසින් 2015 වර්ෂය සඳහා එහි සේවකයන්ට රු.256,500 ක දිරි දීමනා මුදලක් වෙන්කර තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ මෙහෙයුම් වලින් වූ ප්‍රතිඵලය රු.3,479,000 ක ඌනතාවයක් විය.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යය සාධනය**

(අ) 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත අනුව අයනීකාර විකිරණ වලට නිරාවරණය වීම හා බැඳුණු අවදානම් වලින් පුද්ගලයින් හා පරිසරය ආරක්ෂා කිරීම සඳහා සහ ප්‍රභවයන්ගේ හා පහසුකම් වල ප්‍රවේශම සහ සුරක්ෂිතතාවය සඳහා ද යෝග්‍ය පරිදි විධිවිධාන යෙදීම, එමගින් පුද්ගලයින්ගේ හා පරිසරයේ ආරක්ෂාව තහවුරු කිරීමට යෝග්‍ය පියවර ගැනීම, ශ්‍රී ලංකාව විසින් අනුකූලතාවය දැක්වියයුතු යැයි නියමිත න්‍යෂ්ටික බලශක්ති ක්ෂේත්‍රයට අදාල ජාත්‍යන්තර ප්‍රමිති හා බැඳීම් වලට අනුකූලතාවය දක්වන බව තහවුරු කිරීම මෙම සභාවේ අරමුණ වේ. පනතේ 87 (1) වගන්තිය මඟින් සභාවට අවශ්‍ය නීතිමය අධිකාරිය ලබාගැනීම සඳහා රීති සෑදීමේ බලය ලබාදී ඇති අතර, ඒ අනුව 2015 වර්ෂය තුල සභාව විසින් රීති දෙකක් සහ එක් නියෝගයක් සකස් කර අංක 1924/27 හා 2015 ජුලි 21 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කර තිබුණි. පනතේ 87 (1) වගන්තියේ (අ) සිට (ඌ) දක්වා වූ කරුණුවලට අදාල අනෙකුත් රීති පිළියෙල කිරීමට ආයතනයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව සැලසුම් කර තිබුණද, මෙම ක්ෂේත්‍රයට අදාල විශේෂඥ දැනුමක් සහිත නිලධාරීන් යොමුකර නොමැතිවීම නිසා අදාල රීති සකස් කර ගැනීමේ කටයුතු ප්‍රමාද වී තිබූ බව නිරීක්ෂණය විය.

**4.2 කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අනුමත කාර්ය මණ්ඩලය 39 ක් වුවද තාත්වික සේවා මට්ටමක් පවත්වා ගැනීමට හා සේවක සංඛ්‍යාව පිළිබඳ කාලීන සමාලෝචනයක් සිදු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික ශ්‍රේණිවල එක් පුරප්පාඩුවක්ද, තෘතීය මට්ටම් වල පුරප්පාඩු 09 ක් ද, ද්විතීය මට්ටමේ පුරප්පාඩු 06 ක් ද, ප්‍රාථමික අංශ වල පුරප්පාඩු 04 ක් ද වශයෙන් ආයතනයේ පුරප්පාඩු 20 ක් පැවතුණි.

(ආ) සභාවේ විද්‍යාත්මක නිලධාරීන්ගේ පුරප්පාඩු හේතුවෙන් සභාව විසින් සිදුකරනු ලබන විකිරණශීලී පරීක්ෂා සිදුකිරීමේ ප්‍රමාදයන්ද, කළමනාකරණ සහකාර පුරප්පාඩු හේතුවෙන් ගිණුම් අංශයේ හා ආයතන අංශයේ ප්‍රමාණවත් වැඩ බෙදීමක් කළ නොහැකි වී තිබීමද විගණනයේදී නිරීක්ෂණය විය.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

---------------------------------------

### 5.1 අභ්‍යන්තර විගණනය

---------------------

ආයතනයේ කටයුතු පරීක්ෂා කර වාර්තා කිරීම සඳහා 2015 වර්ෂය තුළදී අභ්‍යන්තර විගණන අංශයක් හෝ නිලධාරියෙකු පත්කර නොතිබුණු අතර අභ්‍යන්තර විගණන සැලසුමක් සකස් කර ක්‍රියාත්මක කිරීමටද කටයුතු කර නොතිබුණි. 2016 පෙබරවාරි 01 දින සිට අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත් කර තිබුණු අතර ඔහුගේ කාර්යයන් සඳහා සහාය වීමට වෙනත් කිසිදු නිලධාරියෙකු අනුයුක්ත කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලන

-----------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුවේ.

**(අ) ස්ථාවර වත්කම් පාලනය**

දේපල, පිරියත හා උපකරණ අගය කිරීම, ලේඛනගත කිරීම, ආරක්ෂා කිරීම හා සභාවේ සම්පත් අරමුණු ඉටුකර ගැනීම සඳහා කාර්යක්ෂමව උපයෝජනය කිරීම.

**(ආ) ණයගැතියන් පාලනය**

ණයගැතියන් හා වෙනත් ලැබිය යුතු මුදල් අප්‍රමාදව එකතුකර ගැනීම හා ගිණුම්ගත කිරීම.

**(ඇ) මානව සම්පත් කළමනාකරණය**

සභාවේ අරමුණු ඉටුකර ගැනීම සඳහා වූ කාර්යභාරය හා ප්‍රමාණය අනුව මානව සම්පත් කළමනාකරණය කර ගැනීම.

**(ඈ) අයවැය ලේඛනයමය පාලනය**

තාත්විකව සකස් කර පාලන කාරකයක් ලෙස යොදා ගැනීම.